# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2271/62 – 2022 මාර්තු මස 19 වැනි සෙනසුරාදා – 2022.03.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 127 බී ඕපාත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඕපාත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BPP/2019/345 හා 2020.10.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' - කුඩාතොට කුඹුර *හෙවත්* කුඩාතොල්ලේ කුඹුර - ප්‍රමාණය: හෙක්. 0.2562

උතුරට:අන්නාසි වත්තෙගෙ කරනේලිස් හිමිකම් කියන මොහිදීන් කුඹුර සහ මාදොළ රක්ෂිතය; නැගෙනහිරට: මාදොළ රක්ෂිතය; දකුණට: මාදොළ *හෙවත්* හෝලුවාගොඩ ඇළ; බටහිරට: මාදොළ *හෙවත්* හෝලුවාගොඩ ඇළ සහ අන්නාසි වත්තෙගෙ කරනේලිස් හිමිකම් කියන මොහිදීන් කුඹුර.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2018/IR/488.
2022 පෙබරවාරි මස 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0947

1A – G 36416 – 15 (2022/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*